00019

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ උසස් සහතික පත්‍ර වැඩ සටහන 2021/2022

අවසාන පරීක්ෂණය - 2023

**EPA2816/EPC2816/ESC2316 -** පෙරපාසල් ඉගෙනුම් - ඉගැන්වීම් පිළිබඳ ක්‍රම සහ කළමනාකරණය

කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2023.06.25 වේලාව - පෙ.ව 09.30 - ප.ව.12.30 දක්වා

---

පළමු.වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, දෙවන කොටසේ තෝරා ගනු ලබන ප්‍රශ්න තුනකට ද (03) පිළිතුරු සපයන්න.

## පළමු වන කොටස

01. 'කළමනාකරණය' යනු කුමක්දැයි උදාහරණයක් ඉදිරිපත් කරමින් ඔබේ වචනයෙන් පැහැදිලි කරන්න.

02. පෙරපාසල් ගොඩනැගිල්ලක ඇතුළත් වියයුතු අංශ පහක් (05) ලියන්න.

03. පෙරපාසලක පවත්වාගෙන යායුතු වාර්තා වර්ග පහක් (05) ලැයිස්තුගත කරන්න.

04. පෙරපාසල් දරුවන් සඳහා සෙල්ලම් මිදුලක් සකස් කිරීමේ දී සලකා බැලිය යුතු කරුණු තුනක් (03) කෙටියෙන් සාකච්ඡා කරන්න.

05. පෙරපාසලක දෛනික වැඩ සැලසුම් කිරීමෙන් ගුරුවරයාට අත්වන වාසි පහක් (05) ලියන්න.

06. දරුවන් තුළ පූර්ව ගණිත සංකල්ප සංවර්ධනය කිරීම සඳහා පෙරපාසලක තිබිය යුතු ඉගෙනුම් ද්‍රව්‍ය පහක් (05) ලියන්න.

07. පෙරපාසලක ළමයින් තක්සේරු කිරීම සඳහා පෙරපාසල් ගුරුවරියකට අනුගමනය කළ හැකි ක්‍රම පහක් (05) ලැයිස්තුගත කරන්න.

08. පෙරපාසලක ක්‍රියාකාරකම් සඳහා ළමයින් කණ්ඩායම් කළහැකි ක්‍රම පහක් (05) ලියා දක්වන්න.

(ලකුණු 05 x 08 = 40)

## දෙවන කොටස

09. (i) ඇගයීම හා තක්සේරුකරණය අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) සම්භවන ඇගයීම හා සම්පිණ්ඩිත ඇගයීම වෙන් වෙන්ව පැහැදිලි කරන්න. (ලකුණු 10)

10. (i) මූල්‍යමය සම්පත් යන්න පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii) පෙරපාසලකට මූල්‍යමය සම්පත්වල අවශ්‍යතාව පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) පෙරපාසලකට අවශ්‍ය මූල්‍යමය සම්පත් ලබාගත හැකි ආකාර තුනක් (03) පැහැදිලි කරන්න. (ලකුණු 10)

11. (i) පෙරපාසලක් කාර්යක්ෂම ලෙස පවත්වාගෙන යාමේ දී ගුරුවරියගේ භූමිකාව සාකච්ඡා කරන්න. (ලකුණු 10)

(ii) පෙරපාසල් අධ්‍යාපනය සම්බන්ධයෙන් රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවල කාර්යභාරය පැහැදිලි කරන්න. (ලකුණු 10)

12. (i) පෙරපාසලක් වැඩිදියුණු කිරීම සඳහා පාරිසරික සම්පත් අප සොයා ගන්නේ කෙලෙස ද? (ලකුණු 10)

(ii) ශ්‍රී ලංකාවේ පෙර පාසල් අධ්‍යාපනය සම්බන්ධයෙන් වර්තමානයේ පවතින ගැටලු සාකච්ඡා කරන්න. (ලකුණු 10)

13. (i) පෙර පාසලක කාල කළමනාකරණය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 06)

(ii) පෙර පාසලක කාල කළමනාකරණයේ දී සැලකිල්ලට ගත යුතු කරුණු තුනක් (03) උදාහරණ සහිත ව සාකච්ඡා කරන්න. (ලකුණු 14)

හිමිකම් ඇවිරිණි.